# ඓතිහාසික උණවටුන වැල්ලේ දේවාල මහාවිහාරය ආශ්‍රිත සාමූහික අභිචාර විධි

එස්. එච්. පී. සචිත්‍රානි[1], ආර්. ජී. පී. පී. රාජපක්ෂ[2], එච්. වී. සී. සිරිකුමාරි[3]

## හැඳින්වීම

දෙවියන්ගේ ආරම්භයත් පුද පූජා වල ආරම්භයත් ආදිම වනචාරී මිනිසාගෙන් ආරම්භ විය. ලෝකයේ පවත්නා ආගම් අතරින් ප්‍රථම ආගමද දෙවියන් ඇදහීම බවට පත් විය. එය වර්තමානය දක්වාම පවතී.මිනිසා තුළ පවත්නා භයත්,ආශාවත් හේතුවෙන් පරමාර්ථයන් මුදුන් පත් කර ගැනීමට දේව විශ්වාස ආරම්භ විය.නොපෙනෙන දෙවියන් දිව්‍ය ලෝකවල හා ගස්වල,පර්වතවල වාසය කරති යැයි මුල් යුගයේ ආදීතමයන් විශ්වාස කරන ලදී.දෙවියන් තමන් පදිංචි ස්ථාන වලට ආසන්නයේ පදිංචි කරවා ගැනීම වඩා උචිත යැයි කල්පනා කරන ලද මුල් යුගයේ මානවයා දෙවියන් උදෙසා ගොඩනැගිලි සාදා දෙවියන් ස්ථිර ලෙස පදිංචි කර ගත්හ.ලෝකය මැවූ දෙවියෙක් හෝ වෙන යම් කිසි අද්භූත බලයක් පිළිබඳ විශ්වාසයක් මූලික බුදුදහම තුළට ඇතුළත් නොවේ.ලංකාව ථේරවාදී බෞද්ධ රටක් වුවත් රටේ පුරවැසියන්ගෙන් වැඩි පිරිසක් බුදුදහමට අමතරව දේව විශ්වාසයන් ඇදහීම සිදු කරයි. ශ්‍රී ලංකාව පුරා අභිචාර හා බැදී පවතින ඓතිහාසික ස්ථානයන් සමූහයක් හඳුනා ගත හැකි අතර ඓතිහාසික උණවටුන වැල්ල දේවාලයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. සීනිගම දෙවොල් පුදබිම හැරුණ පසු දෙවොල් දෙවියන් වෙනුවෙන් වසර 700 කට පමණ පෙර ඉදි වූ ප්‍රධාන දේවාලයක් ලෙස ඓතිහාසික උණවටුන වැල්ලේ දේවාල පුදබිම හඳුනා ගත හැකිය. වර්තමානය වන විට බෞද්ධ ආගමික පසුබිමක් සහිතව දේව සංකල්පය ක්‍රියාත්මක වන මෙම ස්ථානයේ ප්‍රජාවගේ සහභාගීත්වයෙන් සිදුවන සාමූහිකඅභිචාර පිළිබඳව අධ්‍යයනය කිරීම වැදගත් වේ.

## අධ්‍යයන ගැටලුව

වැල්ලේ දේවාල මහා විහාරය ආශ්‍රිතව බැතිමතුන්ගේ දායකත්වය සහිතව ඉටු කරනු ලබන අභිචාරයන්ගේ ස්වභාවය කුමක් ද?

1 සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර
2 සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර
3 සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර
piumisachithrani@gmail.com.

ප්‍රධාන අරමුණ

වැල්ලේ දේවාල මහා විහාරය ආශ්‍රිතව ක්‍රියාත්මක වන සාමූහික අභිචාර හඳුනා ගැනීම.

ක්‍රමවේදය

ගාල්ල දිස්ත්‍රික්කයේ උණවටුන ප්‍රදේශයේ යද්දෙහිමුල්ල ග්‍රාමය තුළ ඓතිහාසික වැල්ල දේවාල මහා විහාරය පිහිටා තිබේ. වැල්ලේ දේවාල පුදබිම ආශ්‍රිතව සිදු කරන අභිචාර අධ්‍යයනය කිරීමේ දී ප්‍රාථමික දත්ත කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. මූලිකවම පුද්ගල අත්දැකීම් හා අදහස් ලබා ගැනීම මෙම පර්යේෂණය වඩා වැදගත් වූ බැවින් ගැඹුරු සම්මුඛ සාකච්ඡා කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. විහාරාධිපති හිමියන් ප්‍රධාන ප්‍රතිචාරකයා වූ අතර මීට අමතරව බැතිමතුන්,දේවාලයේ ප්‍රධාන කපුමහත්වරුන් සහ පත්තිනිවරයා ප්‍රතිචාරකයන් ලෙස සම්මුඛ සාකච්ඡාවට සම්බන්ධ කර ගන්නා ලදී. අධ්‍යයනයේ ප්‍රධාන අධ්‍යයන ක්‍රමවේදය ලෙස "ප්‍රපංචවේදී ක්‍රමවේදය" යොදා ගන්නා ලදී. ද්විතීයික දත්ත රැස්කිරීම සඳහා ග්‍රන්ථ සහ අන්තර්ජාලය භාවිත කරන ලදී. මූලිකවම දත්ත විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම සඳහා තේමාකරණය භාවිතා කරනු ලබයි. මෙම පර්යේෂණයට අදාළව ගුණාත්මක දත්ත විශ්ලේෂණාත්මකව සහ සන්සන්දනාත්මකව විග්‍රහ කරමින් අවසන් නිගමන කරා එළඹෙයි.

විශ්ලේෂණය

1. ඓතිහාසික වැල්ලේ දේවාලය ආශ්‍රිත ශුද්ධ සමයේ සිදුවන සාමූහික අභිචාර

ඇසළ හෝ නිකිණි මාසයේ උත්සව සමය හෙවත් ශුද්ධ සමය කප් සිටුවීමෙන් ආරම්භ වේ. කප් සිටුවා සත්වන දින පෙරහැර මංගල්‍යය පවත්වනු ලබයි. ශුද්ධ සමයේ දී ගමේ සියලු ගෙවල් පිරිසිදු කර දින හතක් පුරා පහන් පැල් තනවා පහන් දල්වනු ලැබේ. ඒ අතරතුර කාලයේ උදේ, දවල් ,සවස බුද්ධ පූජාව හා දේව පූජාව සිදුකරනු ලබයි.ලංකාවේ නන්දෙසින් පැමිණෙන බැතිමතුන් දේවාශිර්වාදය පතා දෙවොල් උත්සවයට ප්‍රධාන දායකත්වයක් දක්වයි. දෙවන දින නානුමුර මංගල්‍යක් ද අවසාන දින රැය පහන් වන තුරු මහා කෝල්මුර යාගයක් ද දෙවොල් බල පරාක්‍රමය සිහි ගැන්වීම පිණිස ගිනි මැල තරණය ද සිදුකර ආශිර්වාද ලබා ගනී. උත්සවය අවසන්වන දින රාත්‍රී කාලයේ දේව යාගයක් ගමේ වස් දොස් හැරීමට පැවැත් වනු ලබයි.සුවිශේෂී ම චාරිත්‍රය පැවැත්වෙන්නේ හත්වන දිනයේ දීය. එය දෙවියන් උදෙසා සිදු කරනු ලබන කිරි ආහාර පූජාවකි. සුභ මොහොතින්

කිරි ඉතිරවීම දෙවොල් දෙවියන් වැඩ සිටින දේවාල භූමියේදී සිදුකරනු ලබයි. සහල් පිරිසිදු කිරීම සඳහා මහ සයුරේ කරවටක් බැස සහල් සේදීමේ කටයුතු කරනු ලබයි. පොල් ගෑම, පිටි කෙටීම, කිරි පතු ගෑම දේවාල භූමිය තුළ ම බැතිමතුන්ගේ සාමූහික සහයෝගය සහිතව සිදු කරනු ලබන අතර දායකත්වය ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සිදු වේ.බුදු පුද හා දෙව් පුද නිමවා පිළිවෙලින් මහා සංඝ රත්නයටත් පත්තිනිවරුන්ටත්, කපු මහතුන්ටත් කිරි දානය පිරිණමයි. පුරාණ චාරිත්‍රක් ලෙස නවක බිළිඳුන් වෙනුවෙන් ඉඳුල් කට ගෑම ඉන් අනතුරුව සිදු කරනු ලබයි. මෙම චාරිත්‍රය ප්‍රධාන කපු මහතා සිදු කරනු ලබන අතර එය නවක බිළිඳුන් ඉඳුලේ දැමීම යනුවෙන් හඳුන්වනු ලබයි. මෙම පූජාවෙන් අනතුරුව වැල්ලේ දේවාලයේ ශුද්ධ සමය අවසන් වේ.

## 2. බැතිමතුන් විසින් දේවාලය ආශ්‍රිතව සිදු කරන පුදපූජා සහ අභිචාර විධි

වැල්ලෙ දේවාල මහා විහාරයආශ්‍රිතව දෙවොල් දෙවියන් හා බැඳී පවතින විවිධ අභිචාර පවතී. අධිභෞතික බලවේග තම යහපතට යොදා ගැනීම සඳහා පිළිවෙත්,කෙම්,ප්‍රජා විධි යන ආදිය උපක්‍රමශීලී ලෙස උපයෝගී කර ගැනීම අභිචාර යනුවෙන් හැඳින් වේ. (කුමාර, 2013; 329) පුද්ගල යහපත මෙන්ම අයහපත සඳහා ද අභිචාර පවතී.මානව සුභ සාධනය සඳහා හේතු වන අභිචාර "සුදු අභිචාර" ලෙසත් මිනිසාගේ අයහපත දුර්භාග්‍ය සඳහා හේතු වන අභිචාර "කළු අභිචාර" ලෙසත් මැලිනොව්ස්කි හඳුන්වා ඇත. කළු අභිචාර හා සුදු අභිචාර අතරින් මෙම පුදබිම ආශ්‍රිතව බහුතරයක්පවත්වනු ලබන්නේ සුදු අභිචාරයන් ය. එම සුදු අභිචාර ලෙස,

- විභාග සමත් වීම සඳහා
- නඩු හබ වලින් ජය ගැනිම සඳහා
- ලෙඩ රෝග සුව වීම සඳහා
- ව්‍යාපාර දියුණුව
- සශ්‍රික කටයුතු
- රැකියා අපේක්ෂාවන් හා උසස්වීම්
- දරු ඵල අපේක්ෂාව

එදිනෙදා ජිවිතයේ දී තමන් මුහුණපාන ගැටලු සඳහා දෙවියන්ගේ පිහිට පතන බවත් දෙවියන් උදෙසා භාරහාර වී පඬුරු ගැටගැසීමට සහ පළතුරු පූජාවන් පැවැත්වීමට මිනිසුන් පෙළඹේ. බැතිමතුන් සුදු අභිචාරයන් සිදු කරමින් මෙම

දේවාලය තුළින් ආශිර්වාද ලබා ගනී.බැතිමතුන්ගේ අපේක්ෂාවන් වෙනුවෙන් යාතිකා සහ සෙත් ශාන්ති සිදු කිරීම ප්‍රධානවම සිදු වේ.

### 3. පෙරහැර ආශ්‍රිත සාමූහික අභිචාර

පෙරහැරට ප්‍රධාන දායකත්වය ප්‍රදේශවාසීන්ගෙන් හිමි වන අතර මූල්‍යමය දායකත්වය දින 7 ක් පුරා ඒකරාශි වන බැතිමතුන්ගේ සාමූහික ආධාර මත සිදු කරනු ලබයි. මෙහි පවතින විශේෂත්වය වන්නේ අනෙක් පෙරහැරවල මෙන් නිළබල ක්‍රමයක් නොපැවතීමයි. නිළමෙවරයා යන චරිතය සංකේතානුසාරීව පමණක් හඳුනා ගතහැකිය. දහම් පාසල් ශිෂ්‍යයෙක් නිළමේවරයා ලෙස ඇඳුමෙන් සරසවා පෙරහැරේ ඉදිරියෙන් ගමන් කරවයි.පෙරහැරෙහි සංස්කෘතිකාංග ලෙස උඩරට පහතරට සබරගමු නර්තනාංග අන්තර්ගත වේ. නවාංග ලෙස ද්‍රවිඩ අනන්‍යතාවයෙන් යුක්ත අංග වර්තමානය වන විට පෙරහැරට අන්තර්ගත වී තිබේ. එය ආගමික සංහිඳියාව සහ බහු ආගමික සහයෝගීතාවය නිරූපනය වන සුවිශේෂී අවස්ථාවකි. නමුත් ද්‍රවිඩ ප්‍රජාව දෙවොල් පෙරහැර සමඟ සම්බන්ධ වීම බෞද්ධ බැතිමතුන්ට සාපේක්ෂව අවම මට්ටමක පවතී. දේව ප්‍රතිමාව සමඟ කරඬුව වැඩමවීම දෙවොල් පෙරහැරෙහි සුවිශේෂී අංගය වේ. සුභ මොහොතින් කපුගෙවත්ත ඓතිහාසික අමරසිංහාරාමයෙන් දේව ප්‍රතිමාව වැඩමවීම සිදු කරනු ලබන අතර එම ප්‍රතිමාව පෙරහැර දිනය පුරාම වීථි සංචාරය කරනු ලබයි. පෙරහැර අවසානයේ දෙවොල් දෙවියන්ගේ ප්‍රතිමාව දේවාල භූමියට රැගෙන ගොස් පුදපූජා පවත්වා සිරිත් පරිදි නැවතත් අමරසිංහාරාමයට වැඩම කරවනු ලබයි.

### සමාලෝචනය

කාලය හා අවකාශයේ ඇති වන විප්ලවීය වෙනසක් සමඟම සාම්ප්‍රදායික දිවි පෙවෙතක් ගෙවන ලද මිනිසා සංකීර්ණ කාර්යබහුල වූ දිවි පෙවෙතකට විතැන් වූ අතර ඊට සමගාමීව මානව අවශ්‍යතාවන් ද සංකීර්ණ විය. පුද්ගලයින්ගේ සමාජ හුදකලාභාවය ද තරඟකාරිත්වය වර්ධනය විය.සමාජයේ පැවති ශක්තිමත් අන්තර් පුද්ගල සම්බන්ධතාවයන් බිඳවැටීම සිදු වූ අතර පැවති සමාජ සංශක්තිය ද අභියෝගයට ලක්විය. සමාජයේ පුද්ගලයන් තුළ ඇති වන බිය අනාරක්ශිතතාවය හා අවිනිශ්චිතතාවය හේතුවෙන් ඇති වන මානසික අර්බුදයන් හමුවේ කෙටිකාලීන සුවයක් ප්‍රාර්ථනා කර තම ගැටලුකාරී තත්ත්වයන් ආගමට සහ දේවත්වයට භාර කරමින් මානසික සහනයක් අපේක්ෂා කරයි. වර්තමානයේ සිය දූර්වලතාවයන් සාධාරණීකරණය කර ගැනීමේ මෙවලමක් ලෙස ආගම යොදාගැනීමට පුද්ගලයා

නැඹුරු වී තිබේ. ආගම යන්න අනෙකුත් සමාජ සංස්ථා අතුරින් ප්‍රබලතම සමාජ සංස්ථාවක් බවට පත්ව ඇත්තේ, කිසිදු ප්‍රශ්න කිරිමකින් තොරව අවිවාදයෙන්ම සියලු දෙනා විසින් පිළිගැනිමට ලක් කිරිම හා අසීමිත බලයක් හා අනුහස් සහිත වූවක් ලෙසින් දැඩි සාමාජීය පිළිගැනිමකට ලක්ව ඇති බැවිනි. මෙම අධ්‍යනයට අනුව , වැල්ලේ දේවාලය ආශ්‍රිතව බැතිමතුන්ගේ විශ්වාස පද්ධතිය ගොඩනැගී ඇත්තේ පෞද්ගලික අභිමතාර්ථයන් මුදුන්පත් කර ගැනිම සඳහා ය. රැකියා අවස්ථාවන්, අධ්‍යාපනික ජයග්‍රහණයන්, දරු එල අපේක්ෂා, නඩු හබ ජයග්‍රහනයන්, විවාහ කල් පමාවන්, ව්‍යාපාර දියුණුව, ලෙඩ රෝග සුව වීම හා අපල උපද්‍රව වලින් මිදීම වැනි පෞද්ගලික අභිමතාර්ථ ඉටු කර ගැනිම සඳහා යොමු වීමේ දැඩි ප්‍රවනතාවක් හදුනා ගත හැකිය. උණවටුන වැල්ලේ දේවාල මහා විහාරය ආශ්‍රිතව ප්‍රධානව ම බැතිමතුන්ගේ සක්‍රීය ක්‍රියාකාරීත්වය ශුද්ධ සමයේ දී හඳුනා ගත හැකිය. මුල් යුගයේ දී දේවාලයේ හිමිකම ප්‍රදේශයේ ප්‍රභූන්ට හිමි වු අතර ක්‍රමයෙන් එය බෞද්ධාගමික පසුබිමක් පදනම් කරගත් ආයතනික ව්‍යුහයක් වන පන්සල හා බැඳී පවතී. නමුත් දේවාල භූමිය තුළ පන්සල සංකේතයක් ලෙස ක්‍රියාත්මක වන අතර මූලික බුදු දහමේ ඇතුළත් ප්‍රධාන සංකල්පයන් වන භාවනාව වැනි අංග විදේශිකයන්ට හඳුන්වා දී තිබේ. කාලය හා අවකාශයට අනුව පුද්ගලයින්ගේ අභිමතාර්ථයේ ඇති වන වෙනස්කම් හා බැඳෙමින් ආගමේ පවතින මූලික දාර්ශනික ඉගැන්වීම් හා අංගයන් වෙනසකට ලක් වන බව නිගමනය කළ හැකි වේ.

ප්‍රමුඛ පදඃ දේව සංකල්පය, ශුද්ධ සමය; සාමූහික අභිචාර, පෞද්ගලිකත්වය, සමාජ වෙනස්වීම